# කැලණිය විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පළමුවන වසර පරීක්ෂණය (බාහිර ) -2012/13

2016 - පෙබරවාරි

**BCOM E1035 - මූල්‍ය ගිණුම්කරණය**

ප්‍රශ්න සංඛ්‍යාව : 05 කාලය : පැය 03 යි

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

---

01. කමල් සහ නිමල් හවුල් ව්‍යාපාරයක ලාභාලාභ සම සමව බෙදා ගන්නා හවුල්කරුවන් දෙදෙනෙකි. මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පහත පරිදි පැවතියේදී 2014.12.31 දින ඔවුන් හවුල් ව්‍යාපාරය විසුරුවා හැරීමට තීරණය කරන ලදී.

2014.12.31 දිනටමූල්‍ය තත්ත්වප්‍රකාශය

| | වටිනාකම (රු) |
|---|---|
| **වත්කම්** | |
| කල්බදු ඉඩම | 600,000 |
| පිරියත | 470,000 |
| උපකරණ | 250,000 |
| | **1,320,000** |
| තොග | 420,000 |
| ණය ගැතියෝ | 120,000 |
| බැංකු | 110,000 |
| | **1,970,000** |
| **වගකීම්** | |
| ප්‍රාග්ධනය -කමල් | 600,000 |
| නිමල් | 600,000 |
| සංචිත | 100,000 |
| ණය | 400,000 |
| ණයහිමියෝ | 270,000 |
| | **1,970,000** |

වත්කම් පහත පරිදි උපලබ්දි විය.

| | |
|---|---|
| කල්බදු ඉඩම | 720,000 |
| පිරියත | 480,000 |
| උපකරණ | 225,000 |
| තොග | 405,000 |
| ණය ගැතියෝ | 105,000 |

ණයහිමියන් සම්පූර්ණයෙන් පියවීම සඳහා රු 245,000 ක් ගෙවන ලදී. උපලබ්දි වියදම රු. 30,000 ක් විය. ව්‍යාපාරයේ පොත් වසා දැමීම සඳහා උපලබ්දි ගිණුම, බැංකු ගිණුම සහ හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් පිළියෙල කරන්න.

(මුළු ලකුණු 25)

02. අ. පරාදීන ශාඛා සහ ස්වාධීන ශාඛා යන්න නිර්වචනය කරන්න

(ලකුණු 05)

ආ. ගිණුම් අවසාන දිනයේදී ප්‍රධාන කාර්යාලයේ පොත් වල ඇති ශාඛා ගිණුමත් ශාඛාවේ පොත්වල ඇති ප්‍රධාන කාර්යාලයේ ගිණුමත් අතර වෙනසක් ඇති වීමට බලපාහැකි හේතු දක්වන්න

(ලකුණු 05)

ඇ. පහත ගණුදෙනු ශාඛාවේ පොත්වල සටහන් කරන්න

i. ශාඛාවට යැවූ භාණ්ඩ සහ ප්‍රධාන කාර්යාලයෙන් ලද භාණ්ඩ – රු.150,000
ii. ඉහත භාණ්ඩ වලින් රු 10,000 ක භාණ්ඩ ශාඛාව විසින් ප්‍රධාන කාර්යාලයට හරවා යවන ලදී.
iii. ශාඛාව දැරූ ශාඛා වියදම් – රු.5,000
iv. ප්‍රධාන කාර්යාලය දරන ලද ශාඛාවේ කුලිය – රු.12,000
v. සමාගම විසින් රු 50,000 ක් වටිනා භාණ්ඩ බාහිර පාර්ෂවයකින් ණයට ගන්නා ලදී.
vi. ශාඛා විකුණුම් පහත පරිදි විය.
අ. මුදලට රු 250,000
ආ. ණයට රු 135,000
vii. ශාඛාවේ ණය ගැතියෝ පහත පරිදි ඔවුන්ගේ ගෙවීම් කරන ලදී
සෘජුවම ශාඛාවට – රු.50,000 සහ සෘජුවම ප්‍රධාන කාර්යාලයට – රු.25,000
viii. ප්‍රධාන කාර්යාලය විසින් රු.30,000 ක් ශාඛාවේ ගැණුම් වෙනුවෙන් දරන ලදී.
ix. ශාඛාව මිලට ගත් උපකරණ රු. 20,000

x. ශාඛාව විසින් රු 10,000 ක් වටිනා ගෘහ භාණ්ඩ ඔවුන්ගේ ප්‍රයෝජනයට මිලට ගන්නා ලදී. නමුත් මෙම ගෘහ භාණ්ඩ ගිණුම පවත්වා ගෙන යන්නේ ප්‍රධාන කාර්යාලය තුලයි.

xi. ක්ෂය පහත පරිදිවේ.

a. උපකරණ – රු.4,000

b. ගෘහභාණ්ඩ – රු.2,000

xii. ප්‍රධාන කාර්යාලය විසින් ශාඛාවට ඔවුන්ගේ කාර්යාල ප්‍රයෝජනයට එවූ මුදල් – රු.20,000

xiii. ශාඛාව විසින් ප්‍රධාන කාර්යාලයට කල ප්‍රේෂණ – රු.300,000

(ලකුණු 15)

(මුළු ලකුණු 25)

03. අ. මෙහෙයුම් කල්බද්දක් හා මූල්‍ය කල්බද්දක් අතර වෙනස පහදන්න

(ලකුණු 05)

ආ. මෙහෙයුම් කල්බද්දක් සඳහා කල්බදු ගැණුම්කරුගේ පොත් වල ගිණුම් තබන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ඇ XYZ සමාගම කල්බදු ගිවිසුමක් යටතේ බෙදාහැරීමේ ලොරියක් ABC මූල්‍ය සමාගමෙන් කල් බදු ගිවිසුමක් යටතේ ලබාගෙන ඇත. ABC සමාගම මෙම ලොරිය මිලදී ගැනීම සඳහා මෝටර්ස් ට්‍රේඩර්ස්ට රු. 5,000,000 ගෙවූ අතර නීතිමය ගාස්තු ලෙස රු. 169,865.45 ක් දරා ඇත. XYZ සමාගම රු. 1,200,000 වාර්ෂික වාරික අවුරුදු 5 ක් සඳහා ගෙවනු ලබයි. වර්ෂ 5 අවසානයේ ලොරියේ සහතිකනොකළ සුන්බුන් වටිනාකම රු. 1,000,000 කි. (මෙය මූල්‍ය කල්බද්දක් ලෙස හා ව්‍යංග පොළී අනුපාතය 10% ක් ලෙස උපකල්පනය කරන්න. )

i. ABC මූල්‍ය සමාගම විසින් කළ ශුද්ධ ආයෝජනයේ වටිනාකම කොපමණ ද ?

(ලකුණු 04)

ii. එක් එක් වර්ෂය සඳහා ABCමූල්‍ය සමාගම මගින් හඳුනා ගන්නා පොළී ආදායම වගුවක් සකස් කර පෙන්වන්න.

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

04. තෝමස් ඉදිකරන්නෝ ABC සමාගමේ ගොඩනැගිල්ලක් ඉදිකිරීමට බාරගෙන ඇත. ඉදිකිරීම් කටයුතු සඳහා එකඟවූ මිල රු. මිලියන 6කි. ගිවිසුම 2014.07.01 ආරම්භ වූ අතර 2015.09.30 දින අවසන් කිරීමට සැලසුම් කොට ඇත. පහත තොරතුරු 2015.03.31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා තෝමස් ඉදිකරන්නෝ ආයතනයට අදාළ වේ.

| | රු. |
|---|---|
| තැනුම් පොළ වෙත යැවූ අමුද්‍රව්‍ය | 1,000,000 |
| තැනුම් පොළ වෙත යැවූ පිරියත (ශුද්ධ පොත් අගයට) | 1,200,000 |
| ගෙවූ සෘජු වැටුප් | 400,000 |
| ගෙවූ සෘජු වියදම් | 330,000 |
| තැනුම් පොළට අදාළ ප්‍රධාන කාර්යාල වියදම් | 100,000 |
| තැනුම් පොළින් මධ්‍යම ගබඩාවට හරවා යැවූ අමුද්‍රව්‍ය | 90,000 |
| ගණුදෙනුකරුගෙන් ලද මුදල් | 4,500,000 |
| 2015.03.31 දිනට ශේෂයන්<br>තැනුම් පොළ ඇති පිරියත ශුද්ධ පොත් අගයට | 1,000,000 |
| තැනුම් පොළ අමුද්‍රව්‍ය | 70,000 |
| ගෙවියයුතු සෘජු වැටුප් | 20,000 |

අ. ඔබ විසින් 2015.03.31 න් අවසන් වර්ෂය සඳහා ඉදිකිරීම් කොන්ත්‍රාත්තු ගිණුම පිළියෙල කරන්න.

(ලකුණු10)

ආ. ඉතිරි වැඩ නිමා කිරීම සඳහා ඇස්තමේන්තු ගත පිරිවැය රු. 1,500,000 නම් 2015.03.31 න් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනා ගන්නා ලාභය පෙන්වන්න.

(ලකුණු05)

(මුළු ලකුණු15)

05. පහත දෑ සඳහා කෙටි සටහන් ලියන්න.

අ. උපචිත පදනම

ආ. නෛතිකත්වයට වඩා හරය

ඇ. සුදුසුකම්ලත් වත්කම්

ඉ. ව්‍යංග පොළී අනුපාතය

ඊ. අයභාරය

(ලකුණු 03 බැගින්)

(මුළු ලකුණු 15)